Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 08 - 2023

# නර්තනය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

## I කොටස

- සියළු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. හත්වන පා සරඹයේ සරඹ නාමය වන්නේ,
(i) සිව් අඩිය (ii) කරණම් අඩිය (iii) දෙපැති අඩිය (iv) නුහුරු අඩිය

02. ශරීරයේ විවිධ අංග වලට තලමින් නර්තනය කරන ගැමි නැටුමකි.
(i) පතුරු (ii) සවරං (iii) තාලම් (iv) ලී කෙලි

03. ''එදා නිරිඳු සදා කලිගු මැදා නුවර'' ................. මෙය
(i) පතුරු කවියකි. (ii) සිරසපාද කවියකි. (iii) ලීකෙළි කවියකි. (iv) මල්යහන් කවියකි.

04. සරල සැරසිලි අංගයකි.
(i) ගොප් ගෙඩිය (ii) පොල්තෙල් පහන (iii) අයිලය (iv) යහන

05. ''ඉසුරු දෙවිඳු වඩින දිනා''කවියේ දෙවෙනි කවි පදය වන්නේ,
(i) රඟය දැනෙයි කළ රචනා (ii) කවිය නැතිව බොරු වරුණා
(iii) කෙහෙකු විමන දැක නෙතිනා (iv) ඉසුරු දෙව්දු තුති දෙමිනා

- අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

( පනාවිටිය අම්බලමේ, මොණරා, පත්තිනි දේවිය, හරතමුණි, හරක් බොක්කේ සිවිය)

6. ...................................................... පහතරට බෙරයේ බෙර ඇස සඳහා යොදා ගන්නා සම් වර්ගයකි.

7. වෙස් බැඳි නැට්ටුවෙකුගේ සහ නිළියකගේ රූපයක් ...................................................... කණුවක කැටයම් කර ඇත.

8. නර්තන නිර්මාණය කළ හැකි සත්ව චරිතයක් ලෙස ...................................................... හැඳින්විය හැක.

9. පතුරු නැටුම් හා බැඳි ගායනා වලදී ...................................................... පිළිබඳව සඳහන් වෙයි


10. පුද්ගලයෙකුගේ සිතෙහි පවතින හැඟීම් සමුදාය ස්ථායී භාව නමින් හැඳින්වෙන බව .................................................. පඬිවරයා පෙන්වා දී ඇත.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වල වචන අතුරෙන් නොගැළපෙන වචනය තෝරන්න.**

| | | | | |
|---|---|---|---|---|
| 11. | කස්තිරම | අඩව්ව | කලාසම | සීරුමාරුව |
| 12. | අඩිය | පස් අඩිය | තුන් අඩිය | සිව් අඩිය |
| 13. | සරස්වතී | ලක්ෂ්මී | දුර්ගා | පත්තිනි |
| 14. | පතුරු | සවරං | කුළු | උඩැක්කි |
| 15. | හිස | ඇහිබැම | අත් | කඳ |

- **අංක 16 සිට 20 දක්වා ප්‍රහේළිකාව ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.**




**පහළට**

16. පහන් මඩුවේ දී පුද ලබයි.

17. කලාවට අධිපති ලෙස සැලකෙයි.

18. ගැමි නැටුමකි.

**හරහට**

19. ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායකි.

20. ශාන්තිකර්ම වලින් බැහැර වූ නර්තන අංගයකි.

(ල. 1 x 20)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 02කට පිළිතුරු සපයන්න.**

**(1) ඒ ඒ නර්තන සම්ප්‍රදායන්ට ආවේණික වූ වාදන භාණ්ඩ ඇත.**

1. පහතරට බෙරයේ සම්මත දිග කොපමණද?
2. එය හඳුන්වන වෙනත් නම් 2ක් සඳහන් කරන්න.
3. මෙම බෙරය සකස් කිරීමට යොදාගන්නා දැව වර්ග 2 ක් නම් කරන්න.
4. පහතරට බෙරයෙහි රූප සටහනක් ඇඳ කොටස් 3 ක් නම් කරන්න.

**(2) ද්‍රවිඩ ජනයාගේ ඉතාම උසස් වූ හින්දු ආගමික උත්සවයක් ලෙස නවරාත්‍රී උත්සවය හැඳින්විය හැකිය.**

1. නවරාත්‍රී උත්සවයේ පුද ලබන දෙවිවරු තිදෙනා නම් කරන්න.
2. එම උත්සවය පැවැත්වීමේ අරමුණු 2ක් සඳහන් කරන්න.
3. මෙම උත්සවය අවසානයේ ඇති ''විජය දසමි'' යන පූජාව පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

**(3) දේශීය නර්තන කලා ඉතිහාසය පිළිබඳව කරුණු රාශියක් රූකම් ඇසුරෙන් සොයා ගත හැක.**

1. නර්තන කලාව පිළිබඳව කරුණු සොයා ගත හැකි ගල් කැටයම් ආශ්‍රිත ස්ථාන 2ක් නම් කරන්න.
2. නර්තනය පිළිබඳව කරුණු සොයා යෑමේදී ලී කැටයම් රාශියක් එකවර දක්නට ලැබෙන ස්ථානය නම් කර, එහි දක්නට ලැබෙන සාධක 2ක් ලියන්න.
3. අනුරාධපුර කුට්ටම් පොකුණ තුළින් සොයාගත් මූර්තිය පිළිබඳව විස්තරයක් කරන්න.

**(4) ඔබ උගත් ගායන හා ප්‍රස්තාර ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

1. වෛරෝඩි වන්නමේ බෙර පදය නිවැරදිව ප්‍රස්තාර කරන්න.
2. එහි කස්තිරම ලියා දක්වන්න.
3. පතුරු හා සවරම් කවිය බැගින් ලියන්න.

**(5) පහත සඳහන් මාතෘකා වලින් 2ක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.**

1. සතර බීජාක්ෂර
2. නමස්තා අභ්‍යාස
3. සිරසපාද කවි
4. ගොඩ සරඹ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 08 - 2023**

# නර්තනය

ප්‍රායෝගික පරීක්ෂණය

(1) ගායනය -

1. කැමති ගායනයක්. ල.5
2. නම් කරනලද ගායනය.
   (පතුරු/සවරං/සිරසපාද) ල.5

(2) 4,5,6 ගොඩ සරඹ වලින් එකක් කස්තිරම සමග. ල.10

(3) වන්නම්
වෛරෝඩි වන්නම කස්තිරම දක්වා. ල.10

(4) ගැමි නැටුම්
පතුරු/සවරං වලින් එකක් ල.10

(5) චරිත නිර්මාණය
සතුටට පත් මොණරෙක් හෝ බඩගිනි වූ සිංහයෙක් ල.10

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 08 - 2023**

# නර්තනය

පිළිතුරු පත්‍රය

## I කොටස

01. 4
02. 1
03. 2
04. 1
05. 3
06. හරක් සිවිය
07. පනාවිටිය අම්බලය
08. මොණරා
09. පත්තිනි දේවිය
10. භරතමුණි
11. කලාසම
12. පස් අඩිය
13. පත්තිනි
14. උඩැක්කිය
15. ඇහිබැම
16. පත්තිනි
17. සරස්වතී
18. සවරම්
19. පහතරට
20. වන්නම්

## II කොටස

(1)
1. තුන් වියත් තුන ගුලයි. ල . 1
2. දික් බෙරය,යක් බෙරය,රුහුණු බෙරය,දෙවොල් බෙරය, රුහුණු බෙරය, ල . 2
3. පොල්,කිතුල්,ඇහැළ,කොහොඹ ල . 2
4. නිවැරදිව ඇඳීම ල . 2
   කොටස් තුනක් ලකුණු කිරීම ල . 3

(2)
1. දුර්ගා දේවිය,ලක්ෂ්මී දේවිය,සරස්වතී දේවිය ල.3
2. දෙවියන් පිදීම,සශ්‍රීකත්වය හා සෞභාග්‍ය ප්‍රාර්ථනා කිරීම,අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම. (කරුණු 2කට) ල.4
3. නවරාත්‍රී උත්සවයේ දසවන දින පවත්වන සුවිශේෂී පූජාවකි.එය විද්‍යා ආරම්භය ලෙස හඳුන්වන අතර අධ්‍යන කටයුතු ආරම්භ කිරීම සංකේතවත් කරමින් කරනු ලබයි.මෙහිදී අවුරුදු 3න් පහළ පොඩි දරුවන්ට ප්‍රථමයෙන් අකුරු කියවීම ආරම්භ කිරීම කරනු ලබයි. ල.3

(3)
1. ගඩලාදෙණිය,ලෝවාමහාපාය,සැටදාගෙය,යාපහුව,බෙන්තර ගලපාත විහාරය ල.2
   (යනාදී ලෙස පිළිතුරු ලෙස ස්ථාන 2ක් ලියා ඇත්නම්)
2. ඇම්බැක්ක දේවාලය.
   - සිව්රැස් පනේල වල ඇති නළඟන රූප.
   - ලී බාල්කයක කැටයම් කර ඇති ලී කෙළි නර්තනය. (නම්කිරීමට) ල.2
   - මෙහි කතරගම දේවාලයේ ඇති නළඟන රුව හා බෙර වාදන රූපය. (සාධකයට ) ල.2
3. නළඟනගේ නර්තන විලාසයක් දැක්වෙන ලෝකඩ රූපයකි.
   මෙම නළඟන රුව භ්‍රමණ ඉරියව්ව උච්ච අවස්තාවක් ලෙස විචාරකයෝ පවසති. ල.4

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(4) 1.

| / | | | / | | | / | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | |
| ජිං | - | ග | ත | ගො | ගො | ජිං | - | ග | ජිං | - | ග | ල.4 |

2. රුද ගතගත ගත කුකුදත් - ජිංතගත් ජිත් කුංදත්
තකුදගජිං තකුදගජිං තකුද ගතට ගත
කුද කුද ගජිංත ගත් තත් කුන්දත්
තකුද ගතට ගත කුකුදත් තා ල.2

3. නිවැරදිව පතුරු හා සවරම් කවිය බැගින් ලියා ඇත්තම් ල.4

(5) 1. සතර බීජාක්ෂර.

- බෙරයෙන් උපදින මූලික අක්ෂර බීජාක්ෂර ලෙස හඳුන්වයි.මෙය අක්ෂර 4කි.
- උඩරට,පහතරට,සබරගමු සම්ප්‍රදායන්ට අනුව බෙර බසෙහි වෙනස්කම් ඇතත් මූලික අක්ෂර අතර සමානතාවක් ඇති බව.
- උඩරට සම්ප්‍රදායෙහි - තත් ජිත් තොං නං ,
  පහතරට සම්ප්‍රදායෙහි - තත් දිත් තොං නං ,
  උඩරට සම්ප්‍රදායෙහි - තත් ජිත් තොං නං ලෙසද බීජක්ෂර දැක්විය හැක.
- බෙරයකින් උපදින අනෙකුත් අක්ෂර මෙම බීජාක්ෂර මුල් කරගෙන ගොඩනැගෙයි. (යනාදී ලෙස ලියා ඇත්තම් ල.5)

2. නම්‍යතා අභ්‍යාස.

- නර්තනයට අවශ්‍ය පරිදි හිස,කඳ,අත්,පා,බෙල්ල,දෑස යන ශරීරාංග හැඩගස්වා ගැනීමට වැදගත් වන බව.
- නර්තනයට අදාළ හැඩතල සකසා ගත හැකි බව.
- ශරීරයේ නම්‍යතාව ඇති වන බව.
- ශාරීරික ප්‍රසන්නබව ඇති වන බව.

(යනාදී ලෙස නිවැරදි කරුණු ලියා ඇත්තම් ල.5)

3. සිරසපාද කවි.

- ආතුරයන්ගේ හිසේ සිට දෙපතුල තෙක් වැලදී ඇති රෝග ආපදා දුරු කිරීම සඳහා ගායනා කරන බව.
- දේශීය ශාන්තිකර්ම වලදී ගායනා කරන බව.
- විවිධ තාල රූප අනුව ගායනා කරන බව.
- උදාහරණයට කවියක් ලියා තිබීම.

(යනාදී ලෙස නිවැරදි කරුණු ලියා ඇත්තම් ල.5)

4. ගොඩ සරඹ.

- මේ මගින් උඩරට නර්තනයේ ආධුනිකයන්ගේ අංගහාර සැකසෙන බව.
- පා සරඹ වලින් පසුව ආධුනිකයන් දෙවනුව නර්තනය කරන මූලික සරඹ වර්ගය වේ.
- ගොඩ සරඹ 12ක් ඇති බව.
- සෑම ගොඩ සරඹයක් අවසානයේම කස්තිරමක් නටා හමාර කරන බව.
- ගොඩ සරඹ විලම්භ,මධ්‍ය,ධෘත යන ලය තුනටම නටන බව.
- අත් සරඹ ලෙසද හැඳින්වෙන බව.

(යනාදී ලෙස නිවැරදි කරුණු ලියා ඇත්තම් ල.5)